# 16 අභිෂේක ආලේපය දානය කිරීමේ පිළිවෙත



16.1 රූපය - අභිෂේක ආලේපය දානය කිරීම

මෙම පින්තූරය කෙරෙහි ඔබගේ අවධානය යොමු කර, ඔබ සහභාගි වූ අභිෂේක ආලේපය දානය කිරීමේ පිළිවෙතක් පිළිබඳ ව සිහියට නගා ගන්න.

ඔබ පෙර පාඩම්වල දී අභිෂේක ආලේපය පිළිබඳ ව, අභිෂේක ආලේපය ලැබීමට සූදානම් විය යුතු ආකාරය හා අභිෂේක ආලේපය ලැබීමෙන් ලබන ශුද්ධාත්ම දීමනා හා ඵල පිළිබඳ ව උගත්තෙහි ය. මෙම පාඩමෙන් අභිෂේක ආලේපය ලැබීමේ උච්චතම අවස්ථාව වන ''අභිෂේක ආලේපය දානය කිරීමේ පිළිවෙත'' පිළිබඳ කරුණු ඉගෙන ගත හැකි ය.

## අභිෂේක ආලේපය දානය කිරීමේ දිව්‍ය යාගය

### ආරම්භක පිළිවෙත

අපේක්ෂකයන් පෙරටු කොට ගත් රදගුරුතුමන් ඇතුළු පිරිස පෙරහැරින් දේවස්ථානයට ඇතුළු වෙති. අනතුරු ව ඉරු දින දිව්‍ය පූජාවක මෙන් ආරම්භක පිළිවෙත සිදු කරයි.

## දේව වාක්‍ය පිළිවෙත

පළමු වන දේව ප්‍රකාශනය, පිළිතුරු ගීය, දෙවන දේව ප්‍රකාශනය, සුපුවත් ජයනද (සාධුකාරය) හා සුවිශේෂය ප්‍රකාශ කිරීම මෙම කොටසින් සිදු වන අතර දේව වචනයෙන් අපේක්ෂකයන් ඇතුළු මුළු සංඝය ම පෝෂණය කරමින් ධර්මානුශාසනය පැවැත්වේ.

## අභිවෘද්ධි ආලේපය දානය කිරීම සඳහා අපේක්ෂකයන් කැඳවීම

තම මීසමේ අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව ලබා ගැනීමට සූදානම් වී සිටින දරු දැරියන් වෙනුවෙන් මීසම් භාර පූජාප්‍රසාදිතුමා අභිවෘද්ධි ආලේපය සක්‍රමේන්තුව ලබා දෙන මෙන් රජගුරුප්‍රසාදීන් වහන්සේගෙන් ඉල්ලයි. එම දරුවන් ඒ සඳහා නියමාකාරයට සූදානම් වී ඇද්ද? සුදුසු ද? යන වග රාජගුරු ප්‍රසාදීන් වහන්සේ  පූජාප්‍රසාදීන් වහන්සේගෙන් විමසයි. පියතුමා පිළිතුරු දුන් පසු රදගුරුතුමා එම අපේක්ෂකයන් තෝරා ගත් බව ප්‍රකාශ කරයි. මෙසේ තෝරා ගැනීමෙන් පසු ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කරයි.

## ප්‍රසාද ස්නාපන පොරොන්දු අලුත් කිරීම

මෙහි දී නපුර ප්‍රතික්ෂේප කර, විශ්වාසයේ ප්‍රබල සාක්ෂිකරුවන් වීමටත් කිතුනු කැඳවීම තුළ දිවි ගෙවන්නටත් ප්‍රසාද ස්නාපනයේ දී දෙමවුපියන් හා ආත්මික මවුපියන් මගින් වූ පොරොන්දුව, නිදහස් කැමැත්තෙන් අලුත් කරමින්, ක්‍රිස්තියානි කැඳවීම අනුව ජීවත් වීමට දැඩි අධිෂ්ඨානයකින් යුතු ව තම දකුණත දිගු කර අපේක්ෂකයෝ පොරොන්දු දෙති. ඉන් අනතුරු ව රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සුදතුම් වරම් පතා යාච්ඤා කරයි.

## රාජගුරු ප්‍රසාදීන් වහන්සේ අපේක්ෂකයින් මත දෑත් විහිදා ශුද්ධාත්ම වරම් පතා යැදීම

මෙම අනුපිළිවෙත මෙහෙයේ වැදගත් තැනක් ගනියි. පව් සෝදා හැර ජලයෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් නව ජීවනය ලබා දුන් දෙවි ස්වාමීන් වහන්සේ සැනසිලි දායකයාණන් වන ශුද්ධාත්මයාණන් දරුවන් මත වස්වා, ප්‍රඥාවේ හා අවබෝධයේ ද විචාරයේ හා ධෛර්යයේ ද දැනගැන්මේ හා දේව භක්තියේ ද ආත්මයාණන් එවන ලෙසට රාජගුරු ප්‍රසාදීන් වහන්සේ යදියි. තව ද දෙවි පියාණන්ගේ මහෝත්තමභාවය ඉදිරියේ නිසි ගෞරවය දැක්වීමට වරම් පතමින් ද යාච්ඤා කරයි.

## ක්‍රිස්මා තෛලයෙන් ආලේප කිරීම

රාජගුරු ප්‍රසාදීන් වහන්සේ ක්‍රිස්මා තෛලයෙන් අපේක්ෂකයාගේ නළල ආලේප කරයි. එම අවස්ථාවේ දී ඥාන මවුපියෝ අපේක්ෂකයින්ගේ උරහිස් මත අත් තබති. රාජගුරු ප්‍රසාදීන් වහන්සේ, "ශුද්ධාත්මයාණන්ගේ මුද්‍රාව ලබා ගන්නැ''යි පවසමින් එක් එක් අපේක්ෂකයාගේ නලල ක්‍රිස්මා තෛලයෙන් ආලේප කරයි. මෙය අභිවෘද්ධි ආලේපය නැමති දේව ප්‍රසාද නිධානය දනය කිරීමේ බාහිර සලකුණ යි.

මේ මගින් ආත්මයෙහි නොමැකෙන ලාංඡනයක් ලැබෙන බවත් අදාළ කිතුනුවා ක්‍රිස්තු හේවා භටයෙකු කිරීමත් සංකේතවත් කරයි. රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් ක්‍රිස්මා තෛලය ආලේප කිරීමෙන් පසු ව ඇතැම් විට සුළු කම්මුල් පහරක් දෙනු ලැබේ. තමනට පැමිණෙන අභියෝගවලට මුහුණ දෙමින්, ධර්මදූත කාර්යය කිරීමට බැඳී සිටින බව එයින් සංකේතවත් කරයි.

### විශ්වාසකයින්ගේ යැදුම්

අභිවෘද්ධි අලේපය සක්‍රමේන්තුව අර්ථවත් ව ලබමින් පරිණත ජීවිතයකට පා තැබූ සියල්ලන් උදෙසා දෙවි ආසිරි පතමින් යාච්ඤා කෙරේ.

### පඬුරු පිදීම

අභිවෘද්ධි අලේපය ලැබූ සියලු දෙනා ම තම ජීවිත දෙවි මහෝත්තමයාණන්ට භාර කරමින් පඬුරු පිදීමේ පිළිවෙතට සහභාගී වෙති.

**ක්‍රියාකාරකම**

1. අභිවෘද්ධි ආලේප පිළිවෙත සොයා එය ඇතුළත් කරමින් පොත් පිංචක් සකස් කරන්න.

**ජීවිතයට බිඳක්**

*අභිවෘද්ධි ආලේපය ලැබීමට පිළිවෙත හොඳින් අධ්‍යයනය කරමු.*